ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියරේ ප්‍රතිලාභීන් අතර හිමිකම් ඔප්පු බෙදා දේ</u>

2026 අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ශ්‍රී ලංකාවේ වැඩබලන මහ කොමසාරිස් මෛත්‍රේය කුලකර්ණි මැතිතුමා සමඟින් එක්ව ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියරේ ප්‍රතිලාභීන් 165 දෙනෙකු සඳහා හිමිකම් ඔප්පු බෙදා දුන්නේය. ආපදුවෙන් පීඩාවට පත් බදුල්ල දිස්ත්‍රික්කයේ පූනාගල පවුල් 50ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඉදි කළ 'නවෝදයපුරම්' ගම්මානය විවෘත කිරීමේ උත්සවය අතරතුර මෙම හිමිකම් ඔප්පු බෙදා දෙන ලදී.

2. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න; නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු සුසිල් රණසිංහ; ධීවර, ජලජ කටයුතු සහ සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර්; කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ්; වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය සුන්දරලිංගම් ප්‍රදීප්; ඌව පළාත් ආණ්ඩුකාර කපිල ජයසේකර යන මහත්ම මහත්මීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ නිලධාරීන්, ඌව පළාත් ප්‍රධාන ලේකම් සහ නිලධාරීන් ඇතුළු රැසක් මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

3. 2026 අප්‍රේල් මාසයේදී ඉන්දිය උප ජනාධිපති අතිගරු සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා විසින් සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර සම්පූර්ණ කිරීම සනිටුහන් කරමින් එම අදියර යටතේ ඉදි කළ අවසන් නිවාස කිහිපය ප්‍රතිලාභී අයිතියට පත් කරන ලදී. තෙවන අදියර යටතේ වැවිලි ප්‍රජාවේ පවුල් සඳහා නිවාස 4,000ක් ඉදි කරන ලදී.

4. ඉන්දියානු රුපියල් කෝටි 1,835ක සමස්ත වටිනාකමකින් යුත් ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන සුවිශේෂී ව්‍යාපෘතියකි. පළමු අදියර දෙක යටතේ උතුරු සහ නැගෙනහිර පළාත් දෙකෙහි නිවාස 46,000ක් ඉදි කරන ලදී.

5. ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවේ යහපැවැත්ම උදෙසා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින්, 2017 වසරේදී අග්‍රාමාත්‍ය අතිගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර ප්‍රකාශයට පත් කරන ලදී. දැනට ක්‍රියාත්මක

මෙම අදියර යටතේ තවත් නිවාස 10,000ක් ඉදි කෙරේ. මේ වන විට පළමු නිවාස 1,300 හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වීමට ආසන්නය.

6. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සංවර්ධන සහයෝගිතා හවුල්කාරිත්වය ඇමරිකානු ඩොලර් බිලියන 7.5කට අධික අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 880ක් ප්‍රදාන වේ. ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයකින් යුත් මෙම හවුල්කාරිත්වය විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් අවැසිම අයට ප්‍රතිලාභ සලසමින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළම ක්‍රියාත්මකය.

***

**කොළඹ**
***2026 අගෝස්තු 29***